**කන්දකැටිය ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 23 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 16 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කන්දකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණයකරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් සභාවට ලැබී තිබූ ට්‍රැක්ටරයේ වටිනාකම රු.1,155,318 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලදී නොපියවූ අත්තිකාරම් රු.25,164 ක් සමුච්චිත අරමුදලට ගැලපීමෙන් වත්කම් අගය හා සමුච්චිත අරමුදලේ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ශේෂය රු.139,410 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.120,507 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විගණන ගාස්තු වෙන් කර නොතිබුණි.

(ඊ) සෙනසුරාදා සතිපොල භූමිය කුලියට ගැනීම සඳහා ගෙවිය යුතු රු.20,000 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදුකර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.10,678,074 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.13,623,377 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ තොග ලේඛන නඩත්තු කර නොතිබුණි.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (i) 180 වන රීතිය | ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් 09 දෙනෙකු විසින් රු.29,000 ක් ඇප තැන්පත් කර නොතිබුණි. |
| (ii) 218 වන රීතිය | 2015 වර්ෂයට අදාලව ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.371 | සභාව විසින් අවස්ථා 04 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද අත්තිකාරම් රු.67,500 ක් 2015 දෙසැම්බර් 31 වන විටද අයකර නොතිබුණි. |
| (ii) මු.රෙ.571 | 2015 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ රු.69,566 ක් වටිනා තැන්පත් 41 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ1.6 හා 4 වගන්ති | ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ගිය, මිය ගිය සේවකයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.5,247 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/2002/**2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 04 ක් හා ඊට අදාල උපාංග සම්බන්ධයෙන් පරිගණක උපාංග ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 1985 අංක 1 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තිය | 2001 දෙසැම්බර් මස සිට 2013 ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදයට අදාලව සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් නියමිත දිනට නොගෙවීම නිසා 2015 අවස්ථා 05 කදී රු.53,184 ක් අධිභාර ලෙස ගෙවා තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,633,121 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,103,181 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

---------------------------------------

(අ) 2015 ජනවාරි 01 දිනට පැවති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 5 සිට සියයට 13 තරම් දුර්වල මට්ටමක පවතුණි.

(ආ) 2010 වර්ෂයේ සිට අඛණ්ඩවම බදු කරුවන් 05 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.130,614 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1988 අංක 56 හා 2000 52 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 49 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව වී මෝල් 52 ක් හා ගල් වලවල් 03 සඳහා පරිසර බලපත්‍ර ලබා නොගෙන වාර්ෂික වෙළෙඳ බලපත්‍ර පමණක් ලබාගෙන තිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ වෙනුවෙන් රු.1,227,228 ක මුදලක් සහ මුද්දර ගාස්තු රු.772,050 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතට පටහැනිව කටයුතු කරමින් 2015 වර්ෂය තුළදී නිලධාරීන් 42 දෙනෙකුගේ වැටුප මත අයවිය යුතු රු.11,250 ක මුද්දර ගාස්තු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 1996 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත මාසික බදු කුලී මුදල 2015 වන විටද බිල් ගතකර තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ සිට සේවක වැටුපෙන් අඩුකළ රු.422,446 ක් වන දායක මුදල් සේවක අර්ථ සාධක අරමුදලට ප්‍රේෂණය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **වාර්ෂිකප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ ඡේද 4:2 අනුව සෑම ආයතනයක්ම වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත්, ප්‍රාදේශීය සභාව ප්‍රවර්තන වර්ෂයේ දී එසේ කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) තොග පාලනය